සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்

**Department of Samurdhi Development**

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு

Ministry of Rural Development, Social Security and Community Empowerment


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/17/Legal/Empowerment/2026 | | 2026.01. 28 |

සමෘද්ධි චක්‍රලේඛ අංක 2026/07

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන්

**අඩු ආදායම්ලාභී පවුල්වල නීතිමය ගැටලු විසඳාගැනීම සඳහා නීතිමය දැනුවත්කිරීමේ වැඩසටහන් සහ නීති සායන පැවැත්වීම**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව නීති ආධාර කොමිෂන් සභාවේ සහයෝගය ඇතිව අස්වැසුම ප්‍රතිලාභීන් සහ අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් නීතිමය සවිබල ගැන්වීමේ වැඩසටහනක් පැවැත්වීමට සැලසුම්කර ඇත.

02. තමන් මුහුණදෙමින් සිටින නීති ගැටලු, නීති ගැටළුවක් ලෙස හඳුනාගැනීමට අසමත්වීමත්, අධික වියදම නිසා එම ගැටළු විසඳාගැනීමට නොහැකිවීමත්, නොදැනුවත්කම හේතුවෙන් නීතියේ රැකවරණය අහිමිවීමත් මෙම අඩු ආදායම්ලාභී ජනතාව නිරන්තර මුහුණදෙන ගැටළු වේ.

03. අඩු ආදායම්ලාභී ජනතාවගේ එම ගැටළු විසඳාගැනීම සඳහා අවශ්‍ය නෛතික සහන සැලසීම වෙනුවෙන් නීති ආධාර කොමිෂන් සභාව පිහිටුවා ඇත. එකී සභාවේ නීතිඥ සහාය ඇතිව නෛතික ගැටළු හඳුනාගැනීම, උපදේශණය හා නෛතික ක්‍රියාමාර්ග සඳහා යොමුකිරීම මෙම වැඩසටහන මගින් සිදුකරයි.

04. එක් දින වැඩසටහනක් ලෙස සංවිධානය කරනු ලබන මෙම වැඩසටහන මගින් ප්‍රජාව නීතිය පිළිබඳව දැනුවත් කිරීමත්, එක් එක් පුද්ගලයාගේ පෞද්ගලික නීති ගැටළු සඳහා නීති සායනයක් පැවැත්වීමත් සිදු කිරීමට නියමිතය.

05. එබැවින්, ඔබ දිස්ත්‍රික්කයේ / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිලධාරීන් දැනුවත් කර සුදුසු ප්‍රතිලාභීන් අවම වශයෙන් 50 දෙනෙකු සම්බන්ධ කරගත හැකි ස්ථානයක වැඩසටහන පැවැත්වීමට සැලසුම්කර ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තුවක් ද සමග කඩිනමින් නීති අංශය වෙත යොමුකරන මෙන් කාරුණිකව දන්වමි.

06. එම තොරතුරු ලැබීමෙන් පසු ප්‍රදේශය අයත් අධිකරණ බල ප්‍රදේශය තුල පිහිටුවා ඇති නීති ආධාර කොමිෂන් සභා කාර්යාලය වෙත දන්වා එකී වැඩසටහන සඳහා නීතිඥවරුන් යොමුකිරීමට කටයුතු කළ හැකි බව තව දුරටත් දන්වා සිටිමි.


**1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

07. 2026 වර්ෂය සඳහා වැඩසටහන් 40ක් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කර ඇති බැවින් අඩු ආදායම්ලාභී ජනතාවගේ නීතිමය ගැටළු නොමිලේ විසඳා ගැනීම සඳහා පවතින මෙම අවස්ථාව එම ජනතාව වෙත ලබාදීමට ඔබගේ විශේෂ අවධානය යොමුවනු ඇතැයි අපේක්ෂා කරමි.

වැඩි විස්තර සඳහා - එස්.ආර්. විජේසේකර (අධ්‍යක්ෂ නීති) - 071-4455148

ජනක කොල්ලල්පිටිය (කළමනාකරු) - 071-4425637

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත :

01. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
02. සභාපතිතුමා, නීති ආධාර කොමිෂන් සභාව - කා.දැ.ගැ.ස.
03. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
04. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
05. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
06. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
07. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
08. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ගැ.ස.
09. මූලස්ථාන/ සමෘද්ධි බැංකු සමිති/සමාජ සංවර්ධන/ව්‍යාපෘති/සමෘද්ධි බැංකු කළමනාකරුවන් - අ.ක.ස.